දැක්ම

රටේ ප්‍රධානතම විදේශ
විනිමය උපයන
ආයතනයක් වීම

මෙහෙවර

සමාගමට ලබා ගත හැකි
සියළු වෙරළාශ්‍රිත බර
ඛණිජ වැලි වර්ග සහ
වෙනත් ස්වාභාවික සම්පත්
වල අගය ප්‍රශස්ථ
මට්ටමින් වැඩි කිරීම

අන්තර්ගතය

ආයතනික තොරතුරු	01 - 02
සභාපතිවරයාගේ පණිවුඩය	03
අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	04 - 08
ඉස්මතු කිරීම්	09
විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව	10
විගණකාධිපතිතුමාගේ වාර්තාව	11 - 14
මූල්‍ය ප්‍රකාශන	15 - 41

ආයතනික තොරතුරු

නම :	ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්	
නෛතික ස්වභාවය :	පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා රජයට අයත්. වගකීම සීමාසහිත සමාගමකි.	
සමාගම් ලියාපදිංචි අංකය :	PB 587	
ලියාපදිංචි කාර්යාලය :	අංක 341/21, සරණ මාවත, රාජගිරිය	
අධ්‍යක්ෂකවරු :	අයි. රණතුංග මිය	- වැඩ බලන සභාපති
	ආර්. හබීබ් මහතා	- කළමනාකාර අධ්‍යක්ෂ
	එස්. එල්. ඒ. රසාක් මහතා	- විධායක අධ්‍යක්ෂ
	කේ.එල්. රම්‍යකාන්ති මිය	- අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
කළමණාකාර කණ්ඩායම :	ඒ.ඩී.පී. අයි.ප්‍රසන්න මහතා SLAS, B.Sc (Agri) Sp. M.Sc (Mgt.)	- සාමාන්‍යාධිකාරි
	එස්. ඥානේස්වරන් මහතා B.Sc.Eng., ඉංජිනේරු ආයතනය ආශ්‍රිත සාමාජිකයෙකි	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (යන්ත්‍රාගාර/මෙහෙයුම්)
	එල්. එස්. අබේරත්න මහතා මූල්‍ය හා ගණකාධිකරණ (විශේෂ)	- වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන)
	ඩබ්ලිව්.කේ. තමාරා මිය L.I.C.A, APFA	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)
	එම්. ඒ.අයි.ජී. ජයතිලක මහතා L.I.C.A.	- ප්‍රධාන අභ්‍යන්තර විගණක
	ඩබ්ලිව්. ඩබ්ලිව්.ඩී. ඩබ්ලිව්. කුමාර මහතා B.Sc.	- සැපයුම් කළමනාකරු
	පී.බී.එම්.විජේබණ්ඩාර මහතා B.Sc.	- අලෙවි කළමනාකරු

ආයතනික තොරතුරු

විගණකවරු	: විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, පොල්දූව පාර, බත්තරමුල්ල.
බැංකුකරුවෝ	: ලංකා බැංකුව මහජන බැංකුව හැටන් නැෂනල් බැංකුව සෙලාන් බැංකුව
ලේකම්වරු	: (01.01.2017 සිට 03.10.2017 දක්වා) සීමාසහිත පී. ඩබ්ලිව්. කෝපරේට් සෙකටේරියල් (පුද්ගලික) සමාගම, 3/17, කින්සි පාර, කොළඹ 08. (04.10.2017 සිට 31.12.2017 දක්වා) වැඩබලන සමාගම් ලේකම්, නීති නිළධාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, දමයන්ති කුරේ මිය, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,

සභාපතිවරයාගේ පණිවිඩය

මම ඉමහත් ප්‍රීතියෙන් යුක්තව 2017 වර්ෂය සඳහාවූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සංස්ථාව 1957 වර්ෂයේදී වෙරළ ආශ්‍රිත බර ඛනිජ වැලි කැනීම හා සැකසීම සඳහා පිහිටුවන ලදී. මෙම සංස්ථාව "ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්" යන නම යටතේ පූර්ණ රජයට අයත් සීමාසහිත සමාගමක් බවට 1992 පරිවර්තනය කරන ලදී.

ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නියාමනයන්ට යටත්ව ක්‍රියාත්මක වන සමාගමකි.

වර්ෂය තුළ සමාගමේ නිෂ්පාදනය වර්ධනය විය. මෙ.ටො. 47,728 ක ඛනිජ වැලි තුළින් රු.මි. 1,424/- විකුණුම් වටිනාකමක් ලබා ගන්නා ලදී. බදු පසු ලාභය රු.මි.474කි. මෙය මත මහා භාණ්ඩාගාරයට රු.මි.161 ලාභාංශයක් වෙන් කිරීමට හැකි විය. 2016 වර්ෂයට සාපේක්ෂව විකුණුම් ටොන් ගණන අඩු වුවත්, ලැබුණ වැඩි මිළ ගණන් යටතේ ලාභදායිත්වය ඉහළ ගොස් ඇත.

වර්ෂ අවසාන සේවක සංඛ්‍යාව 695 කි. වැඩ මුළු,සම්මන්ත්‍රන හා පුහුණු වැඩ සටහන් හරහා සේවක පුහුණුවට ප්‍රමුඛත්වය ලබාදී ඇති අතර,වැඩපලවල් තුනේම එය ක්‍රියාත්මක කර ඇත. මෙමගින් සේවකයින්ට කර්මාන්තය පිළිබඳ වටිනා දැනුමක් ලබාගැනීමට හැකියාව ලැබී ඇත.

නව වැඩි දියුණු කල යන්ත්‍රාගාරයක් ස්ථාපනය කිරීම සඳහා කෝකිලායි ඉඩම සඳහා කැනීමේ බලපත්‍ර ලබාගැනීම ප්‍රධාන ඉදිරි පියවරකි. නව යන්ත්‍ර අත්පත් කරගැනීම හා ඉඩමෙහි උපයෝජනය මගින් නිෂ්පාදනය හා ආදායම වැඩිකර ගැනීම බලාපොරොත්තුවයි.

අගය එකතු කිරීම අපගේ ප්‍රදාන අභිප්‍රාය වන අතර, ඊළඟ වර්ෂයේදී ඉලක්ක ගත ඉලක්කයන් සපුරා ගැනීමට ලැබේවි යැයි අප විශ්වාස කරන්නෙමු. කෙසේ හෝ රටට ශුද්ධ වටිනාකමක් ලබාදෙන අතර පරිසරය සුරැකීම වැනි වටිනා අනිකුත් සාධකද සැලකිලිමත්ව තුලිත කල යුතුවේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා,ලේකම් සහ කාර්ය මණ්ඩලයත් මහා භාණ්ඩාගාරයත් අපට දිගින් දිගටම ලබාදෙන සහයෝගයට ස්තුතිවන්ත වෙමි.

ඒවගේම, අධ්‍යක්ෂක මණ්ඩලයත් සියළුම මට්ටම්වල සේවයින්ටත් ඔවුන් ලබාදුන් කාර්යශීලි මග පෙන්වීමටත් සහයෝගයටත් හා ආදර්ශවත් දිරියට හා කැපවීමටත් ස්තුතිවන්ත වෙමි.

ඉන්දිකා රණතුංග මිය,
සභාපති - වැඩ බලන

2017 වර්ෂයේදී කරන ලද කාර්යයන්

- ඒකක 12 කින් හා මහල් තුනේ සේවක වාසස්ථානය ඉදි කිරීම
- යාන් ඔය ආදාන වැඩබිමේ සිට IRZ යන්ත්‍රාගාරය සඳහා අමිශ්‍ර ජලය සම්ප්‍රේෂණය කිරීම සඳහා පී. ඊ පයිප්ප එලීම
- වියලි ඇඹරුම් යන්ත්‍ර සේවකයින් සඳහා නැවතුම් කාමර හා සේදුම් කාමර පද්ධතියක් ඉදි කිරීම
- යන්ත්‍රාගාර ක්‍රියා කාරකම් පහසුව සඳහා නවතම වීල් ලෝඩර දෙකක් මිළදී ගැනීම හා එම යන්ත්‍ර ක්‍රියාකරුවන් හට ගල්කුලම සෙට් රැක්හි පුහුණුවක් ලබාදීම
- යන්ත්‍රාගාරයේ පාවිච්චියට බැක්හෝ ලෝඩර් දෙකක් හා ස්කිඩ් ස්ටියර් ලෝඩරයක් මිළදී ගැනීම
- යන්ත්‍රාගාර පහසුව සඳහා නවතම රෝද හතරේ ට්‍රැක්ටර හතරක් මිළදී ගැනීම
- යාන්ත්‍රික වැඩ බිමෙහි ට්‍රැක්ටර් ටේලර් පහක් පිරි සැකසීම
- ටේලින්ස් අධිශ්‍රේණිගත කිරීමේ කාර්යය සඳහා එම යන්ත්‍රාගාරයක් වියලි ඇඹරුම් හලෙහි සේවකයින් විසින් ස්ථාපනය කිරීම
- ටේලින්ස් අධි ශ්‍රේණිගත කිරීම සඳහා එම යන්ත්‍රයක් කාණ්ඩ "ඒ" හි සේවකයන් විසින් වෙට් ග්‍රැවිටි අධිශ්‍රේණිගත යන්ත්‍රාගාරයක් ස්ථාපනය කිරීම
- තෙත ඇඹරුම් යන්ත්‍ර කම්හල් සේවකයින් විසින් රූටයිල් පරිපථයට ඇතුලු කරන අමුද්‍රව්‍ය වල කාන්දම් අන්තර්ගතය අඩු කිරීම සඳහා ඩ්‍රයි මැග්නටික් සෙපරේෂන් යන්ත්‍රයක් සවිකිරීම
- නව එල්.වී. ප්‍රධාන බෙදාහැරීමේ පුවරුවක් බලශක්ති ඒකකයෙහි සවිකිරීම. මෙම නව පුවරුව සවිකිරීමත් සමඟ විදුලිය බිඳ වැටීමකදී විදුලි ජනක යන්ත්‍ර ස්වයංක්‍රියව තත්පර 40 ක් තුළදී පන ගැන්වීම සිදුවේ.
- ඉල්මනයිට්වල තත්වය වැඩි දියුණු කිරීම සඳහා වෙට් හයි ඉන්ටෙන්සිටි මැග්නටික් සේපරේෂන් යන්ත්‍රාගාරයේ නව පාලක පුවරුවක් සවි කිරීම
- බලශක්ති මාපන සහිතව නිවාස යෝජනා ක්‍රමයට විදුලිය ලබාදීම සඳහා ඉහළින් අදින ලද කම්බි සහිත නව ට්‍රාන්ස් පෝමරය ස්ථාපනය කිරීම. මේ නිසා නිවාස යෝජනා ක්‍රමයට වෙළඳ ක්‍රමයට කල අයකිරීම ගෘහස්ථ ක්‍රමයට අයකිරීම සඳහා වෙනස්වන ලද අතර මෙමගින් විදුලි බිලෙහි ඉතිරියක් ලබාගත හැකි වුනි.
- සේවකයන් සඳහා ප්‍රසන්න වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා විදුලි කාර්මික වැඩපල නවීකරනය හා යටිතල පහසුකම් වැඩිකරන ලදී.
- විද්‍යාගාරය සඳහා මැග්නටික් රෝලර් සෙපරේටරයක් මිළදී ගැනීම
- යන්ත්‍රාගාරයෙහි ප්‍රයෝජනය සඳහා නවතම කැබ් රථ 02ක් මිළදී ගැනීම
- මුහුදු වතුර පොම්පයේ සිට වෙට්ගැවිටි අප් ග්‍රේඩින් යන්ත්‍රාගරයට මුහුදු වතුර සම්ප්‍රේෂණය සඳහා පීවීසී පයිප්ප පද්ධතිය නැවත සකසන ලදී.
- ඉල්මනයිට් ගබඩාව අලුත්වැඩියා කිරීම

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි අධ්‍යක්ෂකවරුන් විසින් ඔවුන්ගේ වාර්තාව, 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කල මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව සමග ඉදිරිපත් කරනු ලැබේ.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ලංකා මිනරල් සෑන්ඩ්ස් හි සාංගමික සංස්ථාවලිය හා සාංගමික ව්‍යවස්ථාවලියෙහි දැක්වෙන අරමුණු:-

1. බර ඛණිජ වැලි කැණීම්,වෙන් කිරීම්, පිරිපහදුව හා සැකසුම
2. වෙරළාශ්‍රිත බර ඛණිජ වැලි උපයෝගී කරගෙන වාණිජමය හෝ කාර්මික වටිනාකමක් ඇති ද්‍රව්‍ය හෝ ඒ ආශ්‍රයෙන් නිපදවිය හැකි කුමන හෝ ද්‍රව්‍යයන් නිපදවීම

සහ

3. වෙරළාශ්‍රිත බර ඛණිජ වැලි පිරි පහදුවේදී හෝ සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස නිපදවන කුමන හෝ අතුරු ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය.

නිෂ්පාදනය

මෙම වර්ෂයේ නිෂ්පාදනයන්හි විස්තර පහත සඳහන් පරිදි වේ.

	මෙට්‍රික් ටොන්
ඉල්මනයිට්	47,659
රූටයිල්	2,174
සර්කෝන්	1,061
හයි. ටයි. ඉල්මනයිට්	4,281
සර්කෝන් ක්‍රෑඩ්	365
නන් මැග්නටික් හෙවී මිනරල් කොන්සන්ට්‍රේට්	35,968
ක්‍රෑඩ් සර්කෝන්	7,508
ස්පයිරල් ප්ලාන්ට් ෆයින් කොන්සන්ට්‍රේට්	335
සර්කෝන් ක්‍රෑඩ් – ඉහළ ශ්‍රේණිය	6,500
සර්කෝන් ක්‍රෑඩ් – පහළ ශ්‍රේණිය	10,237
ක්‍රෑඩ් මොනසයිට්	30
ස්ක්‍රීන් ඕවර්සයිස් කොන්සන්ට්‍රේට්	700
මැග්නටයිට්	246
නිව් වෙට් ටේබල් ටේලින්ග්ස්	6,572
	123,636

විකුණුම්

ඛණිජ වැලි මෙට්‍රික් ටොන් 47,728.12 ක් අලෙවියෙන් රු.මි. 1,424 ක ආදායමක් උපයා ඇත.

	මෙට්‍රික් ටොන්	රු.මිලියන
ඉල්මනයිට්	38,039	872
රූටයිල්	1,979	225
සර්කෝන්	945	129
හයි. ටයි.ඉල්මනයිට්	3,750	84
ස්ක්‍රීන් ඕවර්සයිස් කොන්සන්ට්‍රේට්	498	7
සර්කෝන් ක්‍රෑඩ්	1,110	40
සර්කෝන් ක්‍රෑඩ් – ඉහළ ශ්‍රේණිය	1,275	67
සර්කෝන් ක්‍රෑඩ් – පහළ ශ්‍රේණිය	132	0.2
ක්‍රෑඩ් මොනසයිට්	0.12	0.01
	47,728.12	1,424.21

ප්‍රතිඵල හා ලාභාංශ

සමාගමේ බදු පසු ලාභය රු.මි.474 කි. රු.මි.325ක් වූ අවශෝෂණය නොකල

යන්ත්‍රාගාර පොදුකාර්ය පිරිවැය නොවන්නට උක්ත ප්‍රකාශිත ලාභය තවදුරටත් ඉහළ යනු ඇත. සීමිත නිෂ්පාදනයෙහි සහ පුල්මුඩේ ප්‍රදේශයෙන් සෘජු නැව්ගත කිරීම් නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම අන්තර්ග්‍රහණය නොකරන ලද පොදුකාර්ය වියදම් ඇතිවිය.

රුපියල් මිලියන 161 ක මුදලක් ලාභාංශ වශයෙන් වෙන්කරන ලදී.

රු.මි.

	2017	2016
දළ ආදායම	1,424	1,174
දළ ලාභය	953	607
ශුද්ධ ලාභය	474	154

දේපළ, පිරියත හා උපකරණ

සටහන් අංක 12 හි විස්තරවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ලියාහල අගය එහි මූලික පිරිවැය වූ රු. මිලියන 1,304න් සියයට 43 ක් (43 %) පමණ විය. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල අගය මිලියන 258 කි. මෙය යන්ත්‍ර හා යන්ත්‍රාගාර වැඩි දියුණු කිරීම හා නැවත සැකසීම සඳහා වූ පැහැදිලි දර්ශකයක් වේ.

වර්ෂ කිහිපයකට කලින් නිදන් අරමුදලක මුදල් ආයෝජනය කර තිබූ අතර, 2012 වර්ෂයේ ලාභාංශ ගෙවීමට අදාල අරමුදල පාවිච්චි කරන ලදී.

ස්ථාවර වත්කම් වලට වර්ෂය තුළ එකතු කිරීම් රු. මිලියන 123 ක් විය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

කොටස් මිලියන 80 කින් සමන්විත රු.මි. 800 ක ප්‍රකාශිත ප්‍රාග්ධනය නොවෙනස්ව පැවතුනු අතර, භාණ්ඩාගාර ලේකම් විසින් සියළුම කොටස් දරයි. විස්තර සටහන් අංක 24 හා සම්බන්ධ වේ.

සංචිත සහ රඳවාගත් ලාභය

කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය මත රාජ්‍ය සම්පත් කළමණාකාරන සංස්ථාවට රු. මිලියන 500 ක් 2012 වර්ෂය තුළ ගෙවන ලද අතර,අද වන තෙක් නැවත ලැබී නැත. මෙම මුදල හා පොළිය රු.මි.512 ක් රඳවාගත් ලාභයට එරෙහිව කපා හැර ඇත. මෙම හේතුව නිසා රඳවා ගත් ලාභය මෙම මුදලට සමානව පහළ ගොස් ඇත.

කෙටිකාලීන මූල්‍ය වත්කම්

කෙටි කාලීන මූල්‍ය වත්කම් රු.මි.384 සිට රු.මි. 965 දක්වා වැඩි විය.

බදුකරණය

වර්ෂයේ සාමාන්‍ය බදු ප්‍රතිශතය 28% කි. කෙසේ වුවත් අපනයන සඳහා 12% ක සහන බදු ප්‍රතිශතයක් සමාගම භුක්ති විඳී. රු. මිලියන 54 ක් ආදායම් බදු සඳහා වෙන්කරන ලදී.

කොටස් තොරතුරු/මූලික ඉපයීම

කොටසක මූලික ඉපයීම 2016 වර්ෂයේ රු. 1.93 ට සාපේක්ෂව 2017 වර්ෂයේදි රු. 5.92 දක්වා වර්ධනය විය.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශිත දිනට පසුව ඇතිවූ සිදුවීම්

වසර 3 ක කාලයකට ආයෝජනය කර තිබූ සෙලාන් බැංකුවේ ස්ථාවර තැන්පතු රු.මි.900 ක මුදල 2018 වර්ෂය තුළ ආපසු ලබාගෙන, එම මුදල සෙලාන් බැංකුවේ රු.මි. 440 ක් හා ලංකා බැංකුවේ රු.මි. 100 ක බැංකු අයිරා පියවීම සඳහා යොදාගෙන තිබේ.

මූල්‍ය වාර්තාකරන දින සිට මේ දක්වා ගැලපීම් කිරීමට අවශ්‍ය වෙනත් කිසිදු සිදුවීමක් සිදුවී නැත.

රැකියා ප්‍රතිපත්ති

2017.12.31 වන දිනට සේවකයින් සංඛ්‍යාව 695 ක් විය. සලකා බලන වර්ෂය තුළදී කළමනාකරණය විසින් මානව සම්පත් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ මගින් සේවකයින් පුහුණු කිරීම 2017 වර්ෂය තුළදී ද ඉදිරියට ගෙන එන ලදී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම සහ විශ්වාසයට අනුව සේවකයින්ට සහ රජයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් අදාල දිනට නිම කර ඇති බවට සෑහීමකට පත් විය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලය

පහත පරිදි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් වී ඇත.

එම්. ගුණරත්න මහතා - නිසි බලධාරියා
2017-02-07 දින සිට 2017-03-19 දක්වා
- සභාපති
2017-03-20 දින සිට 2017-12-18 දක්වා
(2017-12-19 දින ඉල්ලා අස්වී ඇත.)

අයි. රණතුංග මිය – අධ්‍යක්ෂක
2017.08.15 දින සිට 2017.12.18 දක්වා
– වැඩ බලන සභාපති
2017.12.19 දින සිට අද දින දක්වා

ආර්. හබීබ් මහතා - විධායක අධ්‍යක්ෂක
2017.08.15 දින සිට 2017.12.11 දක්වා
– කළමණාකරන අධ්‍යක්ෂක
2017.12.12 දින සිට අද දක්වා

කේ.එල් රම්‍යකාන්ති මිය- අධ්‍යක්ෂ/මහා භාණ්ඩාගාර නියෝජිත
2017.08.15 දින සිට 2017.12.19 දක්වා

එස්. එල්. ඒ. රසාක් මහතා - අධ්‍යක්ෂක
2017.10.31 දින සිට 2018.01.03 දක්වා

අනාගත සැලසුම්

සමාගමේ අනාගත සැලසුම් නම්,

- නව නිෂ්පාදිත හා ස්ථාන විවිධාංගිකරණය කිරීම.
- අගය එකතු කරන නිෂ්පාදිත ව්‍යාප්ත කිරීම.
- කෝකිලායි උතුරු ප්‍රදේශයේ ස්පයිරල් ග්‍රැවිටි කොන්සන්ට්‍රේෂන් යන්ත්‍රාගාරය ඉදි කිරීම.
- පවත්නා යන්ත්‍රාගාර සංකීර්ණය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම.
- රූටයිල් හා සර්කොන් නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා පරණ හයි ටෙන්ෂන් රෝලර් සෙපරේටර් සහ ප්ලේට් සෙපරේටර් නැවත ප්‍රතිස්ථාපන කිරීම හා අළුත්වැඩියා කිරීම
- වෙට් හයි ඉන්ටෙන්සිටි මැග්නයිට් සෙපරේෂන් යන්ත්‍රාගාරය අළුත්වැඩියා කිරීම
- කාණ්ඩ "ඒ" හි පිහිටි යන්ත්‍ර ක්‍රියාකාරීත්වයට මුහුදු ජලය සැපයීමට ගිල්විය හැකි පොම්පයක් ස්ථාපනය කිරීම

- කාණ්ඩ "ඒ" යන්ත්‍රාගාරය සඳහා දැලක් නිර්මාණය කිරීම හා සැකසීම
- කාණ්ඩ "ඒ" හි පිහිටි කොන්සෙන්ට්‍රේට් සයික්ලෝන් කුළුණ පිරිසැකසීම
- ඩ්‍රයි මිල් හා වෙට් මිල්හි විදුලි පද්ධතිය නවීකරණය කිරීම
- අභ්‍යන්තර විදුලි බෙදාහැරීමේ පද්ධතිය අළුත්වැඩියා කිරීම.
- කි.වො 11 ප්‍රධාන බෙදාහැරීමේ පැනලය ප්‍රතිස්ථාපනය කිරීම
- වියලි සර්කොන් යන්ත්‍රාගාරය සඳහා ෆ්ලූඩිසයිඩ් බෙඩ් ඩ්‍රයර් සවි කිරීම.
- සිවිල් හා විදුලි කාර්මික වැඩපලවල් වැඩි දියුණු කිරීම
- අන්තර්ජාතිකව පිළිගත් ප්‍රමිතීන් වලට අනුව රසායනාගාරය වැඩිදියුණු කිරීම.
- හානිවී පැවතුන ගබඩාව අළුත්වැඩියා කරන ලදී.
- සර්කෝන් නිෂ්පාදනය වැඩිකිරීම සඳහා වෙට් මිල්හි වෙට් ටේබල් 9ක් නැවත ස්ථාපනය කිරීම.
- කාණ්ඩ "ඒ" හි පිහිටි පරණ ආකෘතිය ශක්තිමත් කිරීමට සහායක රාමුව ස්ථාපනය කරන ලදී.
- විද්‍යාගාරය සඳහා XRF යන්ත්‍රයක් මිළදී ගැනීම
- වාහන සේවා ස්ථානය අළුත්වැඩියා කිරීම
- නව හයිඩ්‍රොලික් එක්ස්කැවේටර් ෆෝක් ලිෆ්ට් එකක් මිළදී ගැනීම
- ට්‍රැක්ටරය හා වීල් ලෝඩරය නවතා තැබීම සඳහා ආවරණයක් ඉදි කිරීම
- කාර්ය මණ්ඩල නිළ නිවාස අළුත්වැඩියා කිරීම.
- සේවක නවාතැන් නැවත වයරින් කිරීම
- වෙරළ ආශ්‍රිතව පවතින පොල් වගාව සහ නිවාස යෝජනා ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා ගැබින් තාප්පය ඉදි කිරීම
- සේවකයින්ගේ සුභ සාධන පහසුකම් වැඩිදියුණු කිරීම.
- සේවකයන්ට ඔවුන්ගේ හැකියා දියුණු කර ගැනීම සඳහා පුහුණු කිරීම

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ කිසිදු කොටසක් සඳහා හිමිකමක් නොදරයි. මුළු කොටස් හිමිකම (100 %) මහා භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

සංස්ථාපිත සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම් ඉටුකිරීම සඳහා සමාගම විසින් රු.මි 1.7 ක් වැය කර ඇත. සමාජ සුභසාධන කටයුතු සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම, ආගමික කටයුතු, අධ්‍යාපනික කටයුතු ආදිය මේ යටතේ සිදුකර ඇත.

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

සමාගම සමඟ ඇතිකරගත් කිසිඳු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුම් තුළ අධ්‍යක්ෂවරුන්ගේ ඍජු හෝ වක්‍ර බැඳීමක් නොමැත.

සාංගමික යහපාලනය/අභ්‍යන්තර පාලනය

සමාගමෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරුන් විසින් දරනු ලබයි. වත්කම් ආරක්ෂා කිරීම, උචිත ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම

සහ විශ්වාසනීය මූල්‍ය තොරතුරු උත්පාදනය සහතික කිරීම සඳහා සමාගමේ පාලන පද්ධතිය නිර්මාණය කර ඇත. කෙසේ වුවත්, ඕනෑම පද්ධතියකට හැකි වන්නේ සාධාරණ සහතික කිරීමක් ලබාදීම පමණක් වන අතර, වැරදි හා අක්‍රමිකතා වැළැක්වීම හෝ සාධාරණ කාලයක් තුළ ඒවා හඳුනා ගැනීම පිළිබඳ නිරපේක්ෂ සහතිකයක් ලබා දිය නොහැක.

මූල්‍ය ප්‍රකාශන කට්ටලය අත්සන් තබන දින දක්වා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම උපයෝගී කරගෙන ඇත.

විගණකවරුන්

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වසර සඳහා බාහිර විගණකවරුන් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ලේකම්වරුන්

සීමාසහිත පී. ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල් (පෞද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස තව දුරටත් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
පී. ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල්
(පෞද්ගලික) සමාගම,
ලේකම්වරු.
වැඩබලන සමාගම් ලේකම්,
නීති නිලධාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,
දමයන්ති කුරේ මිය,
ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

පසුගිය වර්ෂ පහ සඳහා වැදගත් මූල්‍ය තොරතුරු

		2013	2014	2015	2016	2017
දළ විකුණුම් ආදායම	- රු.මි.	679	1,220	1,688	1,174	1,424
දළ ලාභය	- රු.මි.	500	694	821	607	953
වෙනත් ආදායම්	- රු.මි.	56	56	136	55	134
බද්දට පෙර ලාභය	- රු.මි.	30	328	503	170	535
බද්දට පසු ලාභය	- රු.මි.	20	329	457	154	474
අන්තර්ග්‍රහනය නොකල පොදුකාර්ය වියදම්	- රු.මි.	358	259	277	305	325
මුළු වත්කම්	- රු.මි.	2,400	2,829	2,764	3,100	3,489
මුළු වගකීම්	- රු.මි.	715	847	489	556	1,180
කොටස් හිමියන්ගේ හිමිකම්	- රු.මි.	1,684	1,981	2,276	2,544	2,309
ආදායම් බදු	- රු.මි.	10	(2)	46	16	54
මහා භාණ්ඩාගාරයට ලාභාංශ	- රු.මි.	43	14	158.5	54	161
සේවක සංඛ්‍යාව		629	636	847	685	695
බද්දට පෙර ශුද්ධ ලාභය හිමිකමේ ප්‍රතිශතයක් ලෙස		2%	17%	22%	7%	23%
බද්දට පෙර ශුද්ධ ලාභය මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස		1%	12%	18%	5%	15%
ජංගම අනුපාතය		2:1	2:1	4:1	4:1	3:1

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද අධ්‍යක්ෂවරුන් තිදෙනාම විධායක අධ්‍යක්ෂවරුන් වේ. මේ නිසා විගණන කළමනාකරණ කමිටුවට සාමාජිකයින් පත්කර නැත. මේ නිසා 2017 වර්ෂය තුළ කිසිඳු රැස්වීමක් පවත්වා නැත.

සභාපති

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } [illegible]/1/17/21   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2018 ජූලි 31 දින

සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ් සමාගමේ
කොටස් හිමියන් වෙත,

සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ් සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ් සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය ") වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   ag@auditorgeneral.gov.lk   www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

1. පසුගිය වර්ෂ 03 තුල ඛනිජ සංයුතිය අවම වශයෙන් සියයට 40 ක් පමණක් සහිත වැලි තොග සැකසිය හැකි වර්තමාන යන්ත්‍ර උපයෝගී කරගෙන සමාගම් කළමනාකරණය විසින් ඛනිජ සංයුතිය සියයට 7.88 සහිත වැලි තොග (කලාප ඒ සීමාව) රු.607,463,314 කට අගය කර හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද, එවැනි තොග සැකසිය හැකි වන ලෙස පවතින යන්ත්‍ර සැලසුම්කර පරිදි නිර්මාණය නොකර 2017 දෙසැම්බර් 31 දිනට සැකසීමකින් තොරව පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ලාභය සහ අවසන් තොග රු.172,595,796 කින් වැඩියෙන් දක්වා තිබුණි.

2. මහා භාණ්ඩාගාරයේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2011 නොවැම්බර් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථා සමාගමට (එස්ආර්එම්සීඑල්) රු.500,000,000 ක අත්තිකාරකමක් ප්‍රදානය කර තිබූ අතර, හිඟ අත්තිකාරම් හා පොළිය අයකර ගැනීම සඳහා එස්ආර්එම්සීඑල් ට විරුද්ධව අධිකරණ ක්‍රියාදාමයක් තිබියදී එදිනට රු.12,421,448 ක හිඟ පොළී රඳවාගත් ඉපැයීම්වලින් කපා හැර තිබුණි

3. රාජ්‍ය ආයතනවලට ලබාදී තිබූ රු.45,000,000 ක මුදලක් වර්ෂ හයකට අධික කාලයක් අයකර ගැනීමකින් තොරව අත්තිකාරම් ලෙස පැවතිණි.

2

4. රු.5,308,330ක උපිත ආදායම් බදු වෙන්කිරීම සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම් වෙන්කිරීම් යටතේ ගැලපීම් කිරීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනයට ගැලපීම් කර තිබුණි.

5. සමාගම සමාලෝචිත වර්ෂයේ ඉඩ නොහරින ලද දීමනා අඩුකර බදු වගකීම් ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ බදු වගකීම රු.8,673,621 කින් අඩුවෙන් දක්වා තිබුණි.

තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම පරිච්ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට සීමාසහිත මිනරල් සැන්ඩ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) ඉහත මතය සඳහා පදනම, විෂය පථය සහ විගනනයේ සීමාවන් ඉහත දක්වා ඇත.

(ආ) මා දරන්නා වූ මතය

- විගණනය සඳහා අවශ්‍ය වූ සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා ලබාගත් අතර මා විසින් සිදුකරන ලද පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වේ.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඒ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

4

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2017 රු.	2016 රු.
දළ පිරිවැටුම	3	1,424,358,555	1,173,915,676
එකතු කල අගය මත බද්ද		(98,081)	(326,289)
ශුද්ධ පිරිවැටුම		1,424,260,474	1,173,589,387
විකුණුම් පිරිවැය	4	(471,561,438)	(566,332,585)
දළ ලාභය		952,699,036	607,256,802
වෙනත් මෙහෙයුම් ආදායම්	5	37,101,717	3,083,602
		989,800,753	610,340,404
බෙදාහැරීමේ වියදම්	6	(6,827,758)	(6,633,016)
පරිපාලන වියදම්	7	(179,889,185)	(170,221,121)
වෙනත් මෙහෙයුම් වියදම්	8	(364,943,423)	(315,324,692)
		(551,660,366)	(492,178,829)
මෙහෙයුම් ලාභය		438,140,387	118,161,575
මූල්‍ය ආදායම්	9	96,399,804	52,337,064
වර්ෂයේ බදු වලට පෙර ලාභය		534,540,191	170,498,639
ආදායම් බදු වියදම	10	(60,940,329)	(16,360,033)
වර්ෂයේ බදු පසු ලාභය		473,599,862	154,138,606
වර්ෂයේ ශුද්ධ ලාභය		473,599,862	154,138,606
කොටසක සාමාන්‍ය ඉපයීම	11	5.92	1.93
වර්ෂයේ ශුද්ධ ලාභය		473,599,862	154,138,606
විශ්‍රාම ප්‍රතිලාභ බැරකම් මත ශුද්ධ ආයු ගණන ලාභය/(අලාභය)		(12,598,135)	2,859,003
වර්ෂය සඳහා මුළු විස්තර ආදායම		461,001,727	156,997,609

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	2017 රු.	2016 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	12	821,389,073	758,802,341
කල්බදු වත්කම්	13	20,813,639	21,645,046
අස්පෘශ්‍ය වත්කම්	14	468,479	357,054
අත්තිකාරම්	15	45,000,000	557,421,448
මුළු ජංගම නොවන වත්කම්		887,671,191	1,338,225,889
ජංගම වත්කම්			
තොග	16	1,270,630,969	948,590,005
කෙටිකාලීන මූල්‍ය වත්කම්	17	65,215,069	18,981,226
ස්ථාවර තැන්පතු	18	900,000,000	365,313,874
අත්තිකාරම් සහ තැන්පතු	19	49,191,331	46,955,953
කලින් ගෙවූ වියදම්	20	7,076,726	32,618,903
වෙනත් ලැබිය යුතු දෑ	21	309,125,599	302,938,689
ලැබිය යුතු ආදායම් බදු	22	--	20,918,976
මුදල් හා මුදල් වලට සමාන දෑ	23	35,346,730	25,353,081
මුළු ජංගම වත්කම්		2,636,586,424	1,761,670,707
මුළු වත්කම්		3,524,257,615	3,099,896,596
ස්කන්ධය හා වගකීම්			
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	24	800,000,000	800,000,000
වෙනත් සංචිත	25	906,544,343	906,544,343
රඳවාගත් ඉපයීම් / (අලාභ)	26	602,029,845	837,317,294
කොටස් හිමියන්ගේ මුළු හිමිකම		2,308,574,188	2,543,861,637
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂික බැඳීම	27	68,012,638	58,424,744
විලම්භිත බදු	28	55,901,318	48,460,989
ගෙවිය යුතු ආදායම් බදු	29	24,357,801	---------
		148,271,757	106,885,733
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ණය හිමියෝ	30	466,731,800	404,937,520
වෙන්කිරීම් හා උපචිත වියදම්	31	64,431,082	44,211,706
බැංකු අයිරාව	32	536,248,788	----------
මුළු වගකීම්		1,067,411,670	449,149,226
මුළු ස්කන්ධය හා වගකීම්		1,215,683,427	556,034,959
දෙසැම්බර් 31 දිනට		3,524,257,615	3,099,896,596

සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූල බව මම සහතික කරමි.

අත්සන් කලේ – ඩබ්ලිව්.කේ.තමාරා මිය - ප්‍රධාන මූල්‍ය නිළධාරි

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබනු ලැබුවේ

අත්සන් කලේ - අයි. රණතුංග මිය – සභාපති   අත්සන් කළේ - ආර්. හබීබ් - කළමනාකාර අධ්‍යක්ෂ

දිනය - 2018 ජූලි 23 දින

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයීම්/(අලාභ)	මුහුදු යාත්‍රා රක්ෂණ නිදන් අරමුදල් සංචිතය	යන්ත්‍ර හා පිරියත ප්‍රතිස්ථාපනය හා වැඩි දියුණු කිරිමේ නිදන් අරමුදල් සංචිතය	ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි නිදන් අරමුදල් සංචිතය	සේවක වන්දි නිදන් අරමුදල් සංචිතය	සුනාමි අළුත්වැඩියා නිදන් අරමුදල් සංචිතය	එකතුව
2016.01.01 දිනට ශේෂය	800,000,000	631,093,031	111,000,000	706,346,960	171,149,672	10,246,237	18,801,474	2,448,637,374
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	-------	154,138,606	-------	-------	-------	-------	-------	154,138,606
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරන ආදායම	-------	2,859,003	-------	-------	-------	-------	-------	2,859,003
මුහුදු යාත්‍රා රක්ෂණ නිදන් අරමුදල් ගැලපීම්	-------	111,000,000	(111,000,000)	-------	-------	-------	-------	------
රඳවාගත් බදු ගැලපීම්	-------	163,066	-------	-------	-------	-------	-------	163,066
2015/2016 වර්ෂය සඳහා උෟන ආදායම් බදු	-------	(7,988,412)	-------	-------	-------	-------	-------	(7,988,412)
භාණ්ඩාගාරයට ලාභාංශ	-------	(53,948,000)	-------	-------	-------	-------	-------	(53,948,000)
2016.12.31 දිනට ශේෂය	800,000,000	837,317,294	--------	706,346,960	171,149,672	10,246,237	18,801,474	2,543,861,637
2017.01.01 දිනට ශේෂය	800,000,000	837,317,294	--------	706,346,960	171,149,672	10,246,237	18,801,474	2,543,861,637
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	-------	473,599,862	-------	-------	-------	-------	-------	473,599,862
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරන ආදායම	-------	(12,598,135)	-------	-------	-------	-------	-------	(12,598,135)
පුරස්කාරයට ගැලපීම	-------	(17,559,398)	-------	-------	-------	-------	-------	(17,559,398)
2016/2017 වර්ෂය සඳහා උෟන ආදායම් බදු	-------	(5,308,330)	-------	-------	-------	-------	-------	(5,308,330)
රාජ්‍ය සම්පත් කළමණාකාරනයට අත්තිකාරම්	-------	(512,421,448)	-------	-------	-------	-------	-------	(512,421,448)
භාණ්ඩාගාරයට ලාභාංශ	-------	(161,000,000)	-------	-------	-------	-------	-------	(161,000,000)
2017.12.31 දිනට ශේෂය	800,000,000	602,029,845	--------	706,346,960	171,149,672	10,246,237	18,801,474	2,308,574,188

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.
බදු පෙර ලාභය/(අලාභය)	534,540,191	170,498,639
ගැලපීම්;		
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	74,500,678	75,839,656
පොළී ආදායම්	(96,399,804)	(52,337,064)
පාරිතෝෂික	10,374,656	11,708,997
සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගය	(270,726)	(256,203)
විශ්‍රාම පාරිතෝෂික ආයුගණන අලාභය	12,598,135	------
දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ	(3,249,932)	(1,025,093)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	532,093,198	204,428,932
තොගවල (වැඩිවීම්)/අඩුවීම්	(322,040,964)	28,441,335
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්)/අඩුවීම්	17,119,890	(244,804,859)
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම්/(අඩුවීම්)	61,794,779	62,049,358
ණය පහසුකම්වල වැඩිවීම්/(අඩුවීම්)	---------	--------
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල්	288,966,903	50,114,766
ගෙවූ පාරිතෝෂික	(13,114,170)	(13,720,373)
ගෙවූ ආදායම් බදු	(5,000,000)	(30,893,654)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	270,852,733	5,500,739
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ආයෝජන සඳහා කළ තැන්පත් කිරීම්	(686,887,780)	108,612,596
පොළී ආදායම	(96,399,804)	(52,337,064)
නොනිම් ප්‍රාග්ධන වැඩ	(13,233,654)	(52,106,097)
ඉඩම්, දේපළ,පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	(3,836,584)	(4,568,344)
දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම් වලින් ලද මුදල්	3,249,950	1,794,197
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(797,107,872)	1,395,288
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ගෙවූ ලාභාංශ	----------	--------
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	----------	--------
මුදල් හා මුදල් වලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(526,255,139)	6,896,027
වර්ෂය ආරම්භයේ තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ	25,353,081	18,457,054
වර්ෂය අවසානයේ තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ	(500,902,058)	25,353,081
මුදල් හා මුදල් වලට සමාන දෑ විශ්ලේෂණය		
බැංකුවේ ඇති මුදල්	(501,054,053)	25,178,229
අතැති මුදල්	51,995	154,852
සුළු මුදල්	100,000	20,000
	(500,902,058)	25,353,081

මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයත් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීමක් ඇති සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය, අංක 341/21, සරණ මාවත, රාජගිරිය හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

සමාගමේ ප්‍රධානතම කාර්යය වනුයේ බර ඛණිජ වැලි කැණීම, සැකසීම සහ අලෙවිකරණයයි.

1.3 සමාගමේ සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ දී සමාගමේ සේවක සංඛ්‍යාව 695 ක් විය.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

2.1 සැකසීමේ පදනම

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති - SLFRSs) වලට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRSs) වලට අනුකූලව පිළියෙල කිරීමේ දී නිශ්චිත තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. ඒ සමග ම කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදාගැනීමේ දී ඔවුන්ගේ විනිශ්චයන්ද මේ සඳහා පාදක කරගනී. ඉහළ මට්ටමක සංකීර්ණතාවන් සහිත ඇස්තමේන්තු හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන උප කල්පන හා ඇස්තමේන්තු සහිත ස්ථානයක් සටහන් 2 A න් අනාවරණය කොට ඇත.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම්

අදාළ වන විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වර්ෂය සමග සංසන්ධනාත්මක විය යුතු අවස්ථාවලදී පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම, සංශෝධනය කොට ඇත.

2.3 විදේශ මුදල් පරිවර්තනය

2.3.1 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල්

ආයතනය ක්‍රියාත්මක වන්නා වූ මූලික ආර්ථික පරිසරයට අදාළ වලංගු මුදල් භාවිතා කර මෙම මූල්‍ය වාර්තා වල අඩංගු ගණුදෙනු හා ශේෂයන් වාර්තාකරණය කර ඇත. සමාගමේ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) භාවිතා කර මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

2.3.2 ගනුදෙනු හා ශේෂයන්

ගනුදෙනුව සිදුවන දිනයේ පැවති විනිමය අනුපාතිකය පදනම් කරගෙන විදේශීය මුදලින් සිදුවූ ගනුදෙනු ක්‍රියාකාරි මුදල් ඒකකයට පරිවර්තනය කරන ලදී. විදේශ විනිමය තුළින් ප්‍රකාශිත මූල්‍ය වත්කම් හා බැරකම් වර්ෂ අවසාන දිනට ඇති විනිමය අනුපාතයට පරිවර්තනය කිරීමෙන් සහ එවැනි ගනුදෙනුවන් පියවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විනිමය ලාභ හා අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මූලිකව හඳුනාගෙන ඇත්තේ එම වත්කම් සමාගමේ කළමනාකරණය බලාපොරොත්තු වන පරිදි භාවිතා කල හැකි තත්වය දක්වා ගෙන ඒමට කරන ලද සෘජු වියදම් ද සහිතව පිරිවැයට සටහන් කර ඇත.

දේපළ, පිරියත හා උපකරණ පසුකාලීනව පිරිවැයෙන් එහි සමුච්චිත ක්ෂය හා හානිකරන අලාභ අඩුකල පසු අගයට ගණනය කර ඇත.

පසුකාලීන පිරිවැය වත්කමේ ධාරණ අගයට එකතු කිරීම හෝ වත්කමක් ලෙස හඳුනාගනුයේ එයින් ජනනය වන ප්‍රතිලාභ සමාගම තුලට ගලා එන්නේ නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසදායි ලෙස මැනිය හැකි විටදී පමණයි.

අනෙකුත් සියළු අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා දරන වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අදාල කාල පරිච්ඡේදයට අයත් වියදමක් ලෙස සලකනු ලබයි.

ඉඩම් ක්ෂය නොකරයි. අනෙකුත් වත්කම් සරළ මාර්ග ක්ෂය ක්‍රමයට ගණනය කරන ලද ක්ෂය පහත දැක්වෙන පරිදි එහි තක්සේරු කරන ලද ජීවිත කාලය පුරා වෙන් කරනු ලබය

වැඩබිම් සංවර්ධනය	අවුරුදු 20	5%
ගොඩනැගිලි	අවුරුදු 20	5%
යන්ත්‍රෝපකරණ හා පිරියත	අවුරුදු 10	10%
ලිහිල් මෙවලම් හා උපකරණ	අවුරුදු 10	10%
ලී බඩු, සවිකිරීම් හා උපකරණ	අවුරුදු 10	10%
මෝටර් රථ	අවුරුදු 5 සිට 6.5 දක්වා	15% - 20%

ජල සැපයුම්	අවුරුදු 10	10%
මුහුදු යාත්‍රා	අවුරුදු 10	10%
ගොහොරු පතල්	අවුරුදු 4	25%
පරිගණක දෘඩාංග	අවුරුදු 4	25%

වත්කමක ඇස්තමේන්තුගත නැවත අයකරගත හැකි වටිනාකමට වඩා එහි ධාරණ අගය වැඩි වන අවස්ථාවක, වත්කමේ ධාරණ අගය අයකර ගත හැකි අගය දක්වා වහාම කපාහරිනු ලැබේ.

2.5 අස්පෘශ්‍ය වත්කම්

විශේෂිත පරිගණක මෘදුකාංග හා පද්ධති අත්පත් කරගැනීමට සහ භාවිතයට සුදුසු තත්වයට ගෙන ඒමට දරන පිරිවැය මත පදනම්ව, අත්පත් කරගත් පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති ප්‍රාග්ධනිත කර ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්, පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල අගයට දක්වා තිබේ. මෙම පිරිවැයන් පහත දැක්වෙන පරිදි තක්සේරු කරන ලද ජීවිත කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

පරිගණක මෘදුකාංග	අවුරුදු 4	25%

පරිගණක මෘදුකාංග වැඩ සටහන් නඩත්තු කිරීම ආශ්‍රිත පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි.

2.6 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සමාගම විසින් සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේ දී එහි දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් හි යම්කිසි අපහායනයක් සිදුවී තිබේද නැද්ද යන්න පිළිබඳ නිර්ණය කිරීම සඳහා එම වත්කම්හි ධාරණ අගයන් පිළිබඳව පරීක්ෂාවන කරයි. කිසියම් එවැනි ඇඟවීම් පවතින්නේ නම්, අපහායන අලාභයේ ප්‍රමාණය (පවතී නම්) නිර්ණය කිරීම සඳහා වත්කමේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි. තනි තනි වත්කම් හි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කල නොහැකි අවස්ථාවන් හිදී, සමාගම මූල්‍ය උත්පාදන ඒකකය නිර්ණය කරන අතර එම වත්කම අයත් වන මුලජ උත්පාදන ඒකකයේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

නැවත අයකරගත හැකි අගය වන්නේ, ධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිතයෙන් ලැබෙන වටිනාකමෙහි වඩා වැඩි අගයයි. භාවිතයෙන් ලැබෙන වටිනාකම අගය කිරීමේ දී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන අගයන් ලබාගැනීමට වට්ටම් කළයුතු අතර, එහිදී බදු පෙර වට්ටම් අනුපාතිකය භාවිතා කළ යුතුය. එම වට්ටම් අනුපාතිකය වර්තමාන වෙළඳපලෙහි මුදල් සඳහා ඇති කාල අගයන් අදාල වත්කම් සඳහා වන නිශ්චිත අවදානමත් සැලකීමකින් හෝ ගැලපීමකින් තොරව ඇස්තමේන්තු කළ යුතුය.

වත්කමක (හෝ මුදල් උපදන ඒකකයක) නැවත අයකරගත හැකි අගය එහි වර්තමාන අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තු ගත වුවහොත් වත්කමේ ධාරණ අගය (ගෙවූ මුදල් උත්පාදන ඒකකයක) එහි නැවත අයකරගත හැකි අගය දක්වා අඩුකල යුතුය. අපහායන අලාභයන් වහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගැලපීම් කල යුතුය.

2.7 මූල්‍ය වත්කම්

2.7.1 වර්ගීකරණය

සමාගම තම මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කිරීම පහත පරිදි තීරණය කර ඇත.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු ව්‍යුත්පන්න කල නොහැකි, ස්ථිර හෝ නිශ්චිත වූ ගෙවීම් වලින් යුක්ත වන සක්‍රිය වෙළෙඳ පොළ තුල ලැයිස්තුගත නොවූ මූල්‍ය වත්කම් වේ. මේ තුල අන්තර්ගත වනුයේ ජංගම වත්කම් වන අතර ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන, කල් පිරීමේ කාලය මාස 12 ඉක්මවන මූල්‍ය වත්කම් අදාල වනුයේ නැත. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ යන්නට වර්ෂය අවසාන දිනට ඇති වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, නැවත මිලදී ගත හැකි රාජ්‍ය බැඳුම්කර, රජයේ තාවකාලික අතිරික්ත අරමුදල් වල කර ඇති ආයෝජන, කලින් ගෙවීම්, තැන්පතු, සේවකයන්ට දුන් ණය, මුදල් හා මුදල් සමාන දෑ අඩංගු වේ.

2.7.2 හඳුනාගැනීම හා මුල්වරට අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් මුල් වරට හඳුනා ගත යුත්තේ ආයතනය විසින් ගණුදෙනුව මුල් වරට උත්පාදනය කල දිනයේය. මූල්‍ය වත්කමක් මුල් වරට අගය කල යුත්තේ සාධාරණ අගයට, සෘජුවම අදාල කළහැකි පිරිවැයක් එකතු කිරීමෙනි.

මූල්‍ය වත්කම් හඳුනාගැනීම නවතා දැමිය යුත්තේ මූල්‍ය වත්කමකින් අරමුදල් ගලා ඒමේ අයිතිය කල් පිරුණු විටකදී හෝ එය වෙනත් පාර්ශවයකට මාරු කල විටකදී හා සමාගම මූල්‍ය වත්කමේ අයිතිය මත ඇති ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ මාරු කළ විටදීය.

2.7.3 පසුකාලීනව සිදුකරනු ලබන අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ පසුකාලීනව අගය කල යුත්තේ සඵලදායී පොළී අනුපාතයට ගණනය කල ක්‍රමක්ෂය වූ පිරිවැයෙන් අපහායනය සඳහා වූ වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

2.7.4 මූල්‍ය වත්කම් අපහායනය කිරීම

ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන වත්කම්

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට ප්‍රමාණාත්මක සාක්ෂි තිබේ ද නැද්ද යන්න විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් අපහායනය කිරීම සහ එම අපහායන අලාභය දැරිය යුත්තේ, මුල්වරට හඳුනාගැනීමෙන් පසු ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා අපහායනය වූ බවට ප්‍රමාණාත්මක සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූල්‍ය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කලහැකි නම් පමණි.

ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල අපහායන අලාභය හඳුනාගත යුත්තේ වත්කම පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොළී අනුපාතය මත වට්ටම් කල පසු අගය අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේ දී දරනු නොලබන අනාගත අපේක්ෂිත අලාභ අයත් නොවේ.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය අඩුකල යුතු අතර අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගත යුතුය.

යම් හෙයකින්, පසු කාලපරිච්ඡේදයකදී, හඳුනාගත් අපහායන අලාභය අඩු වුවහොත් සහ එම අඩුවීම අපහායනය හඳුනාගත් පසු ඇතිවූ කිසියම් සිදුවීමකට අදාල කල හැකිනම් කලින් හඳුනාගත් අපහායන අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ යලි ප්‍රත්‍යාවර්තනය කරයි.

2.8 තොග

තොග අගය ප්‍රකාශයට පත් කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයටයි. පිරිවැය හඳුනාගනුයේ බර තැබූ සාමාන්‍ය පිරිවැය අගය මත පදනම්වය. ශුද්ධ උපලබ්ධි අගය ඉදිරිපත් කර ඇත්තේ තොගයෙහි ඇස්තමේස්තු ගත විකුණුම් මිළෙන් විකිණීම සම්පූර්ණ කිරීම සඳහා වන පිරිවැය හා විකිණීම සඳහා අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තු ගත පිරිවැය අඩු කිරීමෙනි.

2.9 වෙළෙඳ ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ යනුවෙන් අදහස් කරනුයේ ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් ඇති වූ භාණ්ඩ විකුණුම් සඳහා පාරිභෝගිකයින් / ගැණුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුලදී එකතු කර ගැනීමට බලාපොරොත්තු වන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර

වෙළෙඳ වත්කම් මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ලදුපත් අගය මත වන අතර, පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් ඇති නොවන්නා වූ, කෙටි කාලයකදී ලබා ගැනීමට බලාපොරොත්තු වන සත්‍ය ලදුපත් අගයෙන් අපහායනය සඳහා වන වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

සමාගම සෑම ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළෙඳ ලැබිය යුතු දෑ අපහානය වී ඇති බවට පැහැදිලි සාක්ෂි පවතීද නැද්ද යන්න විමසා බැලිය යුතුය. වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා වූ අපහායන සාක්ෂි තුල මුදල් එකතු කර ගැනීම සම්බන්ධව ආයතනයේ අතීත අත්දැකීම්, නැතහොත් විලම්භිත ගෙවීම් වල වැඩිවීමක් ඇතුලත් විය හැක. වෙළෙඳ ලැබිය යුතු දෑ අපහායනය වීම හා එම අපහායනය දැරිය යුත්තේ අපහායනය වූ බවට පැහැදිලි සාක්ෂි ඇත්නම් පමණි.

2.10 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මුදල් හා මුදල් සමාන දෑ යන්න තුල අන්තර්ගත වනුයේ අතැති මුදල්, බැංකුවේ ඇති ඉල්ලුම් තැන්පතු, සත්‍ය කල්පිරීමේ කාලය මාස තුනක් හෝ ඊට අඩු ඉහල ද්‍රවශීලතාවයකින් යුතු වෙනත් කෙටිකාලීන ආයෝජනයන්ය.

2.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනය තුල නිරූපණය වනුයේ නිකුත් කල කොටස් හි අගය වේ. " සාමාන්‍ය කොටස් " හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇත.

2.12 මූල්‍ය වගකීම්

සමාගම මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. සමාගමේ වෙනත් මූල්‍ය වගකීම් තුල අන්තර්ගත වනුයේ වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ය. වෙනත් මූල්‍ය වගකීම් මුල්වරට හඳුනාගනුයේ සාධාරණ අගය හා සෘජුවම අය කල හැකි පිරිවැය යන අගයන්ගේ එකතුවටය. මුල්වරට හඳුනාගැනීමෙන් පසු, මෙම මූල්‍ය වගකීම් අගය කර ඇත්තේ කෙටි කාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන, මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නා වූ, සත්‍ය ලදුපත් අගය මතය.

සමාගම මූල්‍ය වගකීම් හඳුනා ගැනීම නවතා දමනුයේ ගිවිසුම් ගත වගකීම් විසර්ජනය කිරීමකදී, අවලංගු කිරීමකදී හෝ කල් පිරීමකදීය.

2.13 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යනු ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් අත්පත් කරගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට ඇති බැඳියාවයි. වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ ඒවා ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුල සිදුවන බැවිනි.

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ගණුදෙනු වන මිල මත වන අතර පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නාවු, කෙටිකාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන සත්‍ය ලදුපත් අගය මතය.

2.14 ජංගම හා විලම්භිත බදු

කාලපරිච්ඡේදය සඳහා වු බදු වියදම තුල අන්තර්ගත වනුයේ ජංගම හා විලම්භිත බදු වේ. වෙනත් විස්තීර්ණ ආදායම් සඳහා අදාල වන්නා වු අයිතමයන් හැරුන කොට, බදු වියදම සමාගමේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගෙන ඇත. මෙහිදී වෙනත් විස්තීර්ණ ආදායම් තුලද බදු හඳුනාගෙන ඇත.

කාලපරිච්ඡේදය සඳහා අදාල වන්නා වු ජංගම ආදායම් බද්ද ගණනය කොට ඇත්තේ කාලපරිච්ඡේදය අවසානයේ බල පවත්නා, සමාගමට අදාළ වන්නාවු බදු නීතිය මත පදනම්වය. කළමනාකරණය විසින් බදු පාලනාධිකාරිය වෙත ගෙවීමට බලාපොරොත්තු වන අගය මත පදනම්ව, සුදුසු තැන්හිදී වෙන්කිරීම් සිදුකර ඇත.

මූල්‍ය ප්‍රකාශන තුල විලම්භිත බදු හඳුනාගෙන ඇත්තේ වත්කම් හා වගකීම් සඳහා වන බදු පදනම මත සහ ඒවා පවත්වාගෙන යන ධාරණ අගය අතර ඇති වන්නාවු තාවකාලික වෙනස්කම් මත පදනම්වයි. ව්‍යාපාර ඒකාබද්ධ වීමේදී, එම ගණුදෙනුවෙන් ගිණුම්කරණ හෝ බදු අයවන ලාභය හෝ අලාභය මත වන බලපෑම හැරුණු කොට මුල්වරට හඳුනාගන්නා වත්කම් හා වගකීම් සඳහා විලම්භිත බදු ගණනය කර නැත. විලම්භිත බදු තීරණය කිරීම සඳහා කාලපරිච්ඡේදයේ අවසාන දිනට බලපවත්නා බදු අනුපාතයන් සැලකිල්ලට ගෙන ඇති අතර විලම්භිත බදු අදාල වන්නා වු බදු වත්කම හඳුනාගැනීමේ දී හෝ විලම්භිත ආදායම් බදු වගකීම පියවීමේ දී අදාල කරගැනීමට බලාපොරොත්තු වේ.

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ එම අනාගත බදු අයකල හැකි ලාභය තාවකාලික වෙනස් කමට එරෙහිව ලබාගත හැකි බව ප්‍රත්‍යක්ෂ වන ප්‍රමාණය දක්වා පමණි.

විලම්භිත බදු හිලව් කිරීමක් සිදුකර කරනුයේ ජංගම බදු වත්කම් වලට එරෙහිව ජංගම බදු වගකීම් හිලව් කිරීම සඳහා නෛතිකමය වශයෙන් බල ගැන්වුනු හිමිකමක් ඇත්නම් පමණක් සහ ආදායම් බදු සඳහා අදාල වන්නා වු විලම්භිත බදු වත්කම් හා වගකීම් පැනවීම එකම බදු අධිකාරියක් විසින් සිදු කරන්නේ නම් පමණි.

2.15 සේවක ප්‍රතිලාභ

ආයතනය සතුව නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන සේවක ප්‍රතිලාභ සැලසුම් ඇත.

2.15.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් වූ කලී සමාගම විසින්, වෙනත් ආයතනයක් සඳහා නිශ්චිත දායක මුදලක් ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ අරමුදලකි. තවදුරටත් පවත්නා වූ දායක ගෙවීමක් සඳහා ආයතනය සතුව පවත්නා වූ නෛතික හෝ ගිවිසුම් ගත බැඳීමක් නොමැත. දායකයන්, සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලබන්නේ ඒවා ගෙවිය යුතු නම් පමණි.

සමාගම විසින් සේවකයාගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% සේවක අර්ථසාධක අරමුදල වෙතටත් (EPF), 3% සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) වෙතටත් දායක වනු ලබයි.

2.15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධව ආයතනයේ වගකීම වනුයේ කාලපරිච්ඡේදය අවසානයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හි වර්තමාන අගය වේ. වාර්ෂිකව මෙහි අගය කිරීම සිදු කරනු ලබන්නේ පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය භාවිතා කොට ගෙනය.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය ආයුගණන වටිනාකම් තක්සේරුව මත තීරණය කරන ලදී. වට්ටම් අනුපාතය, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, අනාගත සේවක පඩි වැඩිවීම, මරණ අනුපාතය හා අනාගත විශ්‍රාම වැඩිවීම පිළිබඳ උපකල්පන ආයුගණනය වටිනාකම තක්සේරුවේදී සලකා බැලේ. තක්සේරුවේ සංකීර්ණත්වය සහ එහි දිගු කාලීන බව නිසා අදාල උපකල්පයන් සලකා බැලිය යුතු තරම් අවිනිශ්චිත තාවන්ට පත්වන අතර බැඳියාවද මෙම උපකල්පන හා ඇස්තමේන්තු මත වෙනස්වීමට ඉහළ සංවේදීතාවක් දක්වයි. අදාල ඇස්තමේන්තුවලදී යොදාගත් ප්‍රධාන උපකල්පන මූල්‍ය වාර්තාවල සටහන් අංක 12 හි දැක්වේ.

2.15.3 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සඳහා වන වගකීම හඳුනාගනු ලබනුයේ සේවකයන් විසින් සපයන ලද සේවාවට අදාළව ගෙවීමට බලාපොරොත්තු වන, වට්ටම් නොකල අගය මතයි.

2.16 වෙන්කිරීම් හා අසම්භාව්‍ය වගකීම්

ක්‍රියාකාරී වියදම් සඳහා වෙන්කිරීමක් හඳුනා ගනු ලබන්නේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනය සතුව වර්තමාන නෛතික හා ගිවිසුම් ගත බැඳීමක් ඇති විටකදීත්, එම වගකීම පියවා දැමීම සඳහා සමාගමේ ආර්ථික සම්පත් පිටතට ගලායාම නිශ්චිත විටකදී, සහ එම අගයන් විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි විටදීය.

වෙන්කිරීම් අගය කරනුයේ වර්තමාන වගකීම් හා බැඳුනු අවදානම් හා අවිනිශ්චිතතාවයන් ඇතුලත්ව, වඩා විශ්වාසදායක සාක්ෂි මත පදනම්ව තක්සේරු කරන ලද වර්තමාන වගකීම් පියවා දැමීම සඳහා අවශ්‍ය වන්නා වූ වියදම් මත වේ.

සම්පත් පිටතට ගලායාමේ හැකියාව නිර්ණය කිරීමට අපහසු වගකීම් හැරුණු විට, අන් සියලු අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සටහන් තුල ප්‍රකාශයට පත් කර ඇත.

2.17 ආදායම් හඳුනා ගැනීම

ආදායම් හඳුනාගෙන ඇත්තේ ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවෙහි සාධාරණ අගයට වන අතර භාණ්ඩ විකුණුම් සඳහා ලැබිය යුතු අගයන් ප්‍රකාශ කර ඇත්තේ එකතු කළ අගය මත වූ බද්ද අඩුකල ශුද්ධ අගයටය. සමාගම ආදායම් හඳුනාගනු ලබන්නේ එම ආදායමේ වටිනාකම පැහැදිලිව හඳුනාගත හැකි විටදී සහ එහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ හැකියාව ප්‍රත්‍යක්ෂ විටදී පමණි.

ආයතනය විසින් ව්‍යාපාරය තුල උත්පාදනය වන්නා වූ ප්‍රධාන ගණයේ ආදායම් හඳුනා ගැනීමට පහත දැක්වෙන ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායක භාවිතා කර ඇත.

2.17.1 භාණ්ඩ විකුණුම්

භාණ්ඩ විකුණුම් වලින් උත්පාදනය වන ආදායම හඳුනාගනුයේ ගැණුම්කරු විසින් භාණ්ඩ පැටවීමේ බිල ලබාගත් පසුව ඒ සඳහා වාණිජමය ඉන්වොයිසිය නිකුත් කළ පසුවයි.

2.17.2 පොළී ආදායම්

පොළි ආදායම හඳුනා ගනු ලබන්නේ සඵලදායී පොළී ක්‍රමය භාවිතා කොට ගෙනය.

2.17.3 දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ඇතිවන ලාභ හා අලාභ

වත්කමේ පවත්වාගෙන යන අගය හා විකුණුම් අගය සැසඳීමෙන් දේපළ, පිරියත හා උපකරණයන්හි ඉවත් කිරීමේ ලාභ හා අලාභ හඳුනා ගනු ලබන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනු ලබයි.

2.18 වියදම්

ව්‍යාපාරයේ මෙහෙයුම් සිදුකරගෙන යාමේදී දරන ලද සියලුම වියදම්, ලාභය හඳුනා ගැනීමේ දී ආදායමට එරෙහිව කපාහල යුතුය.

2.19 ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට පසු හටගන්නා සිදුවීම්

ගිණුම් කාලපරිච්ඡේදයෙන් පසු ඇතිවන සියලු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් හා හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුල අදාල සටහන් වල හෙළිදරව්කර ඇත.

2.20 වගකීම් (බැඳියාව)

ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට ඇති සියළු ප්‍රමාණාත්මක වගකීම් (බැඳීම්) හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් තුලින් හෙළිදරව් කර ඇත.

2ඒ වැදගත් ගිණුම්කරණ තක්සේරු කිරීම් හා මතයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනා ගැනීම හා මැනීම පිළිබඳ කළමනාකරණය විසින් විවිධ වු මත, ඇස්තමේන්තු හා උපකල්පන සැලකිල්ලට ගනු ලබයි.

2ඒ.1 පහත දැක්වෙනුයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් බලපෑමක් කල හැකි මූල්‍ය / ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී භාවිත කරන වැදගත් මතයන්ය.

2ඒ 1.1 විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීම

විලම්භිත බදු වත්කම් කෙතරම් දුරකට හඳුනා ගන්නවාද යන්න තීරණය වනුයේ අනාගතයේ ලැබිය හැකි බදු ආදායම් තක්සේරුවට එරෙහිව උපයෝගි කලහැකි විලම්භිත බදු වත්කමේ සම්භාවිතාව මතය.

2ඒ.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීමේ දී හා අගය කිරීමේ දී බොහෝ දැනෙන බලපෑමක් කලහැකි උපකල්පන හා තක්සේරු කිරීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

2ඒ.2.1 ක්ෂය කල හැකි වත්කමක ඵලදායී ජීව කාලය

වත්කමක අපේක්ෂිත ආර්ථික උපයෝගීතාව මත පදනම්ව, කළමනාකරණය විසින් සෑම වාර්තාකරන දිනකදීම ක්ෂය කල හැකි වත්කමක ඵලදායී ජීව කාලය විමර්ෂණය කල යුතුය. මෙම තක්සේරු වල අවිනිශ්චිතතාවයන් තාක්ෂණික යල් පැනීම් සමඟ සම්බන්ධ වන අතර, නිශ්චිත මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංගයන්ගේ උපයෝගීතාවය වෙනස් කිරීම කෙරෙහි බලපානු ඇත.

2ඒ.2.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමේ වර්තමාන අගය තීරණය කිරීම උපකල්පන ගණනාවක් මත ගොඩනැගුණු පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය මත බලපාන සාධක විශාල ප්‍රමාණයක් මත පදනම් වේ. මෙම උපකල්පන, ශුද්ධ පිරිවැය තීරණය කිරීමට හා වට්ටම් අනුපාත ඇතුලත් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම තීරණය කිරීමේ දී යොදා ගනී. මෙම උපකල්පනයන්ගේ සිදුවන කිසියම් වෙනස්වීමක්, නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ පවත්වාගෙන යන අගය කෙරෙහි මෙම උපකල්පන වල කිසියම් වෙනස්වීමක් බලපානු ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා			2017	2016
	දළ විකුණුම් රු.	වැට් රු.	රු.	රු.

සටහන 03 පිරිවැටුම

	දළ විකුණුම් රු.	වැට් රු.	2017 රු.	2016 රු.
රූටයිල්	224,502,090	-----	224,502,090	215,754,000
ඉල්මනයිට්	872,086,715	-----	872,086,715	211,022,355
සර්කොන්	128,799,473	96,131	128,703,342	30,936,823
හයි. ටයි. ඉල්මනයිට්	84,355,494	-----	84,355,494	27,778,214
නන් මැග්නටික්	---------	-----	---------	190,617,812
ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	---------	-----	---------	132,197,810
සර්කෝන් කෑඩ්	39,754,876	-----	39,754,876	229,965,362
ඉහළ ශ්‍රේණියේ සර්කෝන් කෑඩ්	67,174,412	-----	67,174,412	89,880,676
පහළ ශ්‍රේණයේ සර්කෝන් කෑඩ්	172,260	-----	172,260	3,817,595
කෑඩ් මොනසයිට්	14,948	1,950	12,998	41,618,740
ස්ක්‍රීන් ඕවර් සයිස් කොන්.	7,498,287	------	7,498,287	------------
	1,424,358,555	98,081	1,424,260,474	1,173,589,387

සටහන 04 විකුණුම් පිරිවැය

	2017 රු.	2016 රු.
රූටයිල්	49,076,178	56,644,369
ඉල්මනයිට්	256,111,509	110,925,238
සර්කොන්	24,411,397	9,441,973
හයි. ටයි. ඉල්මනයිට්	50,007,445	43,665,024
නන් මැග්නටික්	----------	72,019,638
ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	----------	59,246,040
සර්කෝන් කෑඩ්	22,448,796	153,522,028
ඉහළ ශ්‍රේණියේ සර්කෝන් කෑඩ්	37,948,021	45,299,060
පහළ ශ්‍රේණයේ සර්කෝන් කෑඩ්	28,552,970	8,488,891
කෑඩ් මොනසයිට්	2,198	7,080,324
ස්ක්‍රීන් ඕවර් සයිස්	3,002,924	----------
	471,561,438	566,332,585

සටහන 05 අනෙකුත් මෙහෙයුම් ආදායම

	2017 රු.	2016 රු.
ප්‍රමාද ගාස්තු වලින් ලද ආදායම	18,132,480	2,058,509
වත්කම් විකිණීම මත ලැබූ ලාභය	3,249,932	1,025,093
විනිමය වෙනස්වීම	15,719,305	-------
	37,101,717	3,083,602

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.
සටහන 06 බෙදාහැරීමේ වියදම්		
වැටුප් හා වේතන	3,819,712	4,016,334
අතිකාල	61,058	62,718
පැමිණීමේ දීමනා	173,800	146,400
ආහාර දීමනා	204,450	222,900
අර්ථසාධක අරමුදල් දායකත්වය	526,776	505,910
බලපත්‍ර ගාස්තු	334,389	122,384
තැපැල් හා දුරකථන ගාස්තු	73,823	74,107
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	223	----
වෙළඳ ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන වියදම් - දේශීය	1,365,425	1,065,500
ප්‍රචාරණ සහ ප්‍රදර්ශණ වියදම්	136,408	----
විනිමය උච්චාවචනය	--	301,615
සේවක භාරකාර අරමුදල	131,694	115,148
	6,827,758	6,633,016
සටහන 07 පරිපාලන වියදම්		
අධ්‍යක්ෂක ගෙවීම්	205,000	58,000
සභාපතිගේ ගෙවීම්	1,143,823	600,000
වැටුප් හා වේතන	267,500	------
වැටුප් හා වේතන	1,244,025	------
විනෝද ගාස්තු	320,565	300,000
ඉන්ධන හා ලිහිසි තෙල්	626,336	205,409
වාහන ධාවන වියදම්	675,000	298,667
වාහන කුලී ගාස්තු	--	12,462
විදේශ සංචාර	25,116	
තැපැල් හා දුරකථන ගාස්තු	95,639	113,903
පරිපාලන/ පොදු වියදම් - සටහන 7 ඒ	175,286,181	168,632,680
	179,889,185	170,221,121
සටහන 07 ඒ පරිපාලන/ පොදු වියදම්		
වැටුප් හා වේතන	58,080,912	61,897,346
අතිකාල	6,414,288	5,972,932
පැමිණීමේ දීමනා	2,796,100	2,533,850
පාරිතොෂික දීමනා	7,311,699	9,337,461
ආහාර දීමනා	3,449,850	3,643,425
සේවක තේ	534,243	648,364
භාෂා දීමනා	82,680	151,771
අර්ථ සාධක අරමුදල් දායකත්වය	7,711,002	7,850,239
සේවක සුභ සාධක	2,365,633	2,369,582
25 වන සේවා ප්‍රශංසා	630,000	------
නිළ ඇඳුම්	2,463,032	2,394,562
වෛද්‍ය දීමනා	243,091	2,365,798
ගමන් වියදම් හා යැපීම්	458,582	447,732

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.
සටහන 07 ඒ පරිපාලන/ පොදු වියදම් (ඉදිරියට ගෙන ඒම)		
විනෝද ගාස්තු	12,453	38,321
සංග්‍රහ	356,343	359,828
වෘත්තීය ගාස්තු	4,366,475	817,751
විදුලිය	2,143,877	2,500,140
ඉන්ධන හා ලිහිසි තෙල්	2,198,316	2,441368
පාරියෝගිකදේ	392,163	884,720
අළුත්වැඩියා හා නඩත්තු	1,435,242	2,483,449
ජල ගාස්තු	318,350	484,653
ඉදිරියට කල නැව් ගාස්තු	-------	142
සේවක පුහුණු වියදම්	1,515,686	2,417,525
කුලී සහ ගාස්තු	9,545,815	10,261,647
රක්ෂණ - මෝටර් රථ	623,015	655,417
රක්ෂණ - පුද්ගල අනතුරු	1,363	45,791
රක්ෂණ - මාර්ගස්ථ මුදල්	32,176	2,146
රක්ෂණ - විශ්වාසනීයත්ව සහතික	126,449	203,828
රක්ෂණ - ගිනි රක්ෂණ	6,748	18,157
රක්ෂණ - වෛද්‍ය	5,547,988	5,103,074
බලපත්‍ර ගාස්තු	61,570	65,220
වාහන ධාවන වියදම්	11,827,021	7,240,763
වාහන කුලී ගාස්තු	237,884	462,253
ජෙනරේටර් කුලී ගාස්තු	20,000	-----
තැපැල් හා දුරකථන	1,629,894	1,528,097
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	1,444,313	1,145,904
පොත් හා වාර සඟරා	7,820	83,407
දායකත්ව වියදම්	873,210	718,565
විවිධ වියදම්	119,345	264,064
විවිධ ගබඩා	-----	720
විගණන ගාස්තු	347,000	215,005
දැන්වීම් වියදම්	85,050	-----
ආයතනික සමාජ වගකීම	1,457,673	30,552
නීති ගාස්තු	3,602,202	529,857
පුවත්පත් නිවේදන	3,609,450	1,332,835
බැංකු ගාස්තු	13,746,236	217,341
ක්ෂයවීම්	1,458,317	7,056,196
මෘදුකාංග ක්‍රමක්ෂය	94,516	181,033
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය	831,406	831,406
සේවක භාරකාර අරමුදල	1,928,072	1,963,148
වැඩ වන්දි	------	13,089,720
ප්‍රසාද දීමනා	1,431,591	1,529,679
ලාභ දිරිගැන්වීම්	9,310,039	1,815,896
	175,286,181	168,632,680

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.

සටහන 08 වෙනත් මෙහෙයුම් වියදම්

	2017	2016
අවශෝෂණය නොකල පොදු කාර්ය වියදම් - සටහන 8.1	325,382,698	305,270,258
හයි.ටයි. ඉල්මනයිට් තොග ගැලපීම - ශු.උ.අ.	--	5,699,101
පහළ මට්ටමේ ක්‍රෑඩ් සර්කෝන් - ශු.උ.අ.	39,449,525	4,375,637
ලියා හැරීම්	--	(20,304)
පරිත්‍යාග	111,200	-------
	364,943,423	315,324,692

සටහන 08.1 අවශෝෂණය නොකල පිරියත පොදු කාර්ය වියදම්

	2017	2016
නෞහාර වියදම්	4,884,232	4,093,507
චුම්භක වෙන් කිරීමේ යන්ත්‍රාගාරය	34,743,044	54,342,544
තෙත් හා වියලි මෝල	10,664,779	18,520,318
අනෙකුත් පිරිවැය මධ්‍යස්ථාන වලින් මාරු කිරීම්	275,090,643	228,313,889
	325,382,698	305,270,258

සටහන 09 මූල්‍ය ආදායම්

	2017	2016
පාරිතෝෂික අරමුදලේ ආයෝජන තුලින් ලද පොලිය	300,807	284,671
සාමාන්‍ය ආයෝජනයෙන් ලද පොලිය	85,014,719	36,817,791
කාර්ය මණ්ඩලය ලබා ගත් ණය මත පොලිය හා අනෙකුත් ආදායම්	8,862,186	4,943,264
නිවාස ණය තුලින් ලද පොලිය - H.D.F.C	1,778,710	2,216,459
විදේශීය විනිමය ගිණුම තුලින් ලද පොලිය	383,486	149,351
S.R.M.C.L. ණය මත පොලිය	--	2,500,000
සන්තකවූ ටෙන්ඩර් තැන්පතු	59,896	5,425,528
	96,399,804	52,337,064

සටහන 10 ප්‍රවර්ථන ආදායම් බදු වියදම

	2017	2016
වර්ෂය සඳහා ආදායම් බදු වියදම - සටහන 10.1	53,500,000	-----
විලම්භිත බදු	7,440,329	16,360,033
	60,940,329	16,360,033

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.

සටහන 10.1 – වර්තමාන ආදායම් බදු වියදම හා ගිණුම්කරණ ලාභය සැසඳුම

	2017	2016
බදු පෙර ලාභය		
ඉඩ නොදෙන වියදම් වල එකතුව	534,540,191	170,498,638
ඉඩ දිය හැකි වියදම් වල එකතුව	192,201,375	182,303,038
අනෙකුත් අදායම් මාර්ග වල ආදායම්හි එකතුව	(107,626,561)	(132,079,266)
වර්ෂය සඳහා බදු අයවන ව්‍යාපාරික ලාභය/ (අලාභය)	(96,339,908)	(46,911,535)
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	522,775,097	173,810,875
බද්දට යටත් වන අනෙකුත් ආදායම්	95,956,422	46,762,184
එකතු ව්‍යවස්ථාපිත ආදායම්	618,731,519	220,573,059
වගන්ති 32 ට අනුව අඩු කිරීම්	(101,651,381)	(82,806,351)
තක්සේරු ගත ආදායම	517,080,138	137,766,708
සුදුසුකම් ලබන ගෙවීම්	(72,280,171)	(151,721,711)
බද්දට යටත් ආදායම	444,799,967	------
වර්තමාන ආදායම් බදු වියදම 12% මත	53,375,996	------
වැටයිම	53,500,000	------
	53,500,000	------

සටහන 11 මූලික කොටසක ඉපයීම

මූලික කොටසක ඉපයීම ගණනය කිරීම පදනම් වී ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය, වර්ෂය තුල බර තැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදීමෙනි.

	2017	2016
සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය	473,599,862	154,138,606
වර්ෂය තුළ බර තැබූ සාමාන්‍ය කොටස් ප්‍රමාණය	80,000,000	80,000,000
කොටසක ඉපයීම (රු.)	5.92	1.93

සටහන 12 දේපළ, පිරියත හා උපකරණ

රු.

විස්තරය	01.01.2017 දිනට ශේෂය	එකතු කිරීම්	(ඉවත් කිරීම්)/ ගැලපීම්	මාරු කිරීම්	31.12.2017 දිනට ශේෂය
පිරිවැය					
සින්නක්කර ඉඩම්	3,029,245	---	---	---	3,029,245
වැඩබිම් සංවර්ධනය	49,107,211	---	---	---	49,107,211
ගොඩනැගිලි	209,076,617	4,999,851	---	---	214,076,468
යන්ත්‍ර හා පිරියත	631,854,080	17,192,142	3,223,351	---	645,722,871
ලිහිසි මෙවලම් හා උපකරණ	45,695,476	4,434,697	146,627	(189,222)	49,794,323
ලී බඩු, සවිකිරීම් හා උපකරණ	28,143,906	2,188,427	22,596	189,222	30,498,960
මෝටර් රථ	176,951,670	91,009,800	1,205,591	---	266,755,879
ජල සැපයුම් යෝජනා ක්‍රමය	14,694,456	---	---	---	14,694,456
මුහුදු යාත්‍රා	10,931,234	---	---	---	10,931,234
පරිගණක දෘඩාංග	16,780,897	3,643,022	1,134,376	---	19,289,543
	1,186,264,792	123,467,939	5,732,541	---	1,303,900,190
ක්ෂය කිරීම්					
සින්නක්කර ඉඩම්	---	---	---	---	---
වැඩබිම් සංවර්ධනය	11,675,376	2,437,545	---	---	14,112,923
ගොඩනැගිලි	66,115,507	8,147,007	---	---	74,262,514
යන්ත්‍ර හා පිරියත	353,167,422	43,845,156	3,323,347	---	393,689,231
ලිහිසි මෙවලම් හා උපකරණ	30,877,171	3,050,660	146,607	---	33,596,042
ලී බඩු, සවිකිරීම් හා උපකරණ	15,436,730	2,320,719	22,590	---	17,920,041
මෝටර් රථ	154,793,995	12,408,909	1,205,589	---	165,997,315
ජල සැපයුම් යෝජනා ක්‍රමය	14,634,309	13,037	---	---	14,647,345
මුහුදු යාත්‍රා	10,235,795	115,105	---	---	10,350,899
පරිගණක දෘඩාංග	15,569,859	1,183,308	1,134,353	---	15,618,814
	672,506,164	73,521,446	5,832,486		740,195,124
ශුද්ධ ධාරණ අගය	513,758,628	---	---	---	563,705,066
ප්‍රාග්ධන නොනිමි වැඩ	245,043,713	13,233,659	593,365	---	257,684,007
	758,802,341	13,233,659	------	---	821,389,073

සටහන 13 කල්බදු වත්කම්

රු.

විස්තරය	01.01.2017 දිනට ශේෂය	එකතු කිරීම්	(ඉවත් කිරීම්) ගැලපීම්	31.12.2017 දිනට ශේෂය
පිරිවැය				
කල්බදු ඉඩම්	24,222,334	-----		24,222,334
ක්‍රමක්ෂය				
කල්බදු ඉඩම්	2,577,288	831,407		3,408,695
ශුද්ධ ධාරණ අගය	21,645,046	831,407		20,813,639

සටහන 14 අස්පෘශ්‍ය වත්කම්

රු.

විස්තරය	01.01.2017 දිනට ශේෂය	එකතු කිරීම්	(ඉවත් කිරීම්) ගැලපීම්	31.12.2017 දිනට ශේෂය
පිරිවැය				
පරිගණක මෘදුකාංග	3,836,584	259,249	---	4,095,833
ක්‍රමක්ෂය				
පරිගණක මෘදුකාංග	3,479,530	147,825	---	3,627,355
ශුද්ධ ධාරණ අගය	357,054	111,424	---	468,478

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.
සටහන 15 අත්තිකාරම්		
සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	--	500,000,000
රාජ්‍ය වැවිලි සංස්ථාව	25,000,000	25,000,000
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	15,000,000	15,000,000
ජාතික කඩදාසි සමාගමට	5,000,000	5,000,000
ලැබිය යුතු පොලිය	--------	12,421,448
	45,000,000	557,421,448

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.

සටහන 16 තොග

විවිධ අයිතම	1,886,173	1,094,505
පාරිභෝගික හා අමතර කොටස්	168,746,272	185,158,284
අමුද්‍රව්‍ය හා අතරමැදි නිෂ්පාදන	139,019,436	64,489,026
නිමි හා අර්ධ සැකසුම් භාණ්ඩ		
– ඉල්මනයිට්	73,365,987	51,679,615
– රූටයිල්	18,441,176	22,982,438
– සර්කොන්	8,114,075	9,874,631
– මොනසයිට්	4,473,756	4,234,761
– හයි. ටයි. ඉල්මනයිට්	26,339,183	23,777,868
– සර්කෝන් කෘඩ්	52,661,624	68,436,878
– ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට්	8,880,781	6,181,258
– හයි ග්‍රේඩ් සර්කෝන් කෘඩ්	99,959,893	63,154,371
– මැග්නටයිට්	1,928,736	1,507,781
– ලෝ ග්‍රේඩ් සර්කෝන් කෘඩ්	53,440,521	11,151,071
– ස්ක්‍රීන් ඕවර් සයිස් කොන්සන්ට්‍රේට්	4,889,365	-----
– නිව් වෙට් ටේබල් ටේලින්ස්	1,020,676	-----
- බ්ලොක් ඒ ටේලින්ස්	607,463,315	434,867,518
	1,270,630,969	948,590,005

සටහන 17 කෙටිකාලීන මූල්‍ය වත්කම්

හැටන් නැෂනල් බැංකුව	-----	16,200,354
ණයගැති පොළී	65,215,069	2,780,872
	65,215,069	18,981,226

සටහන 18 ස්ථාවර තැන්පත්

හැටන් නැෂනල් බැංකුව	------	215,313,874
ලංකා බැංකුව	------	150,000,000
සෙලාන් බැංකුව	900,000,000	----------
	900,000,000	365,313,874

සටහන 19 අත්තිකාරම් සහ තැන්පතු

අත්තිකාරම් හා තැන්පතු	49,191,331	46,955,953
	49,191,331	46,955,953

සටහන 20 ඉදිරියට කල වියදම්

ඉදිරියට කරන ලද වියදම්	7,076,726	32,618,903
	7,076,726	32,618,903

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2017 රු.	2016 රු.

සටහන 21 අනෙකුත් ජංගම වත්කම්

ලැබිය යුතු එකතු කළ අගය මත බදු		118,998,300	116,555,768
විවිධ ණය ගැතියෝ		18,408	1,000
නිවාස ණය - HDFC බැංකුව		57,013,562	62,271,704
වෙනත් ණය ගැතියෝ		7,227,958	5,676,489
සේවක ණය හා අත්තිකාරම්		126,092,352	118,658,709
		309,350,580	303,163,670
අඩුකලා - අපහායනය	21.1	(224,981)	(224,981)
		309,125,599	302,938,689

සටහන 21.1 හානිකරනය/අපහායනය

වෙළඳ ලැබීම් වලට අදාලව අපහායනය සඳහාවූ වෙන් කිරීම් වල වෙනස්වීම පහත පරිදි වේ.

ජනවාරි 01 දිනට ශේෂය	224,981	224,981
වර්ෂය තුළ නැවත අයකර ගැනීම	--------	--------
වර්ෂය අවසානයට ශේෂය	224,981	224,981

සටහන 22 ලැබිය යුතු ආදායම් බදු

ජනවාරි 01 දිනට ශේෂය		(6,096,184)
වර්ෂය තුළ වෙන් කිරීම්	කරුණාකර සටහන	---------
වර්ෂය තුළ ගෙවීම්	අංක 29 බලන්න	34,603,900
ඌණ/අධි වෙන් කිරීම් මත ගැළපීම්		(7,588,740)
දෙසැම්බර් 31 දිනට ශේෂය		20,918,976

සටහන 23 මුදල් හා මුදල් වලට සමාන දෑ

ලංකා බැංකුව, විදේශ මුදල් ගිණුම - ගි.අ. 0073449850	35,143,622	20,464,869
ලංකා බැංකුව, ආයතන ශාඛාව – ගි.අ. 0000000931	-------	3,753,866
ලංකා බැංකුව, පුල්මුඩේ - ගි.අ. 00002367534	13,333	60,752
හැටන් නැෂනල් බැංකුව, කුරුඳුවත්ත ශාඛාව - ගි.අ. 076010004078	19,082	771,135
මහජන බැංකුව, පුල්මුඩේ - ගි. අ. 352-1001-5-0000244	18,698	127,607
අතැති මුදල් - පුල්මුඩේ	51,995	154,852
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	50,000	20,000
විශේෂ අග්‍රිමය - ප්‍රධාන කාර්යාලය	50,000	------
	35,346,730	25,353,081

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු .	2016 රු .

සටහන 24 ප්‍රකාශිත ප්‍රාග්ධනය

	2017 රු .	2016 රු .
නිකුත් කල හා ගෙවා නිමකල 80,000,000 (සාමාන්‍ය කොටස්)	800,000,000	800,000,000

සටහන 25 වෙනත් සංචිත

	2017 රු .	2016 රු .
යන්ත්‍ර හා පිරියත ප්‍රතිස්ථාපන හා වැඩි දියුණු කිරීමේ නිදන් අරමුදල් සංචිතය	706,346,958	706,346,958
ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිලි නිදන් අරමුදල් සංචිතය	171,149,673	171,149,673
සේවක වන්දි නිදන් අරමුදල් සංචිත	10,246,238	10,246,238
සුනාමි අළුත්වැඩියා නිදන් අරමුදල් සංචිත	18,801,474	18,801,474
	906,544,343	906,544,343

සටහන 26 රඳවා ගත් ඉපයීම්/(අලාභ)

	2017 රු .	2016 රු .
ආරම්භක ශේෂය	837,317,294	631,093,031
භාණ්ඩාගාරයට ලාභාංශ	(161,000,000)	(53,948,000)
මුහුදු යාත්‍රා නිදන් අරමුදල සඳහා ගැලපීම	--	111,000,000
පුරස්කාරය සඳහා ගැලපීම්	(17,559,398)	-----
රඳවාගත් බදු සඳහා ගැලපීම	--	163,066
2015/2016 වර්ෂය සඳහා ඌණ ආදායම් බදු වෙන්කිරීම	--	(7,988,412)
විශ්‍රාම ප්‍රතිලාභ ආයුගණන ලාභය/අලාභය	(12,598,135)	2,859,004
රාජ්‍ය සම්පත් කළමනාකරන සංස්ථාවට කල ගෙවීමට අදාල ගැලපීම	(512,421,448)	-----
2016/2017 ආදායම් බදු ඌණ වෙන් කිරීම	(5,308,330)	----
වර්ෂය සඳහා ලාභය(අලාභය)	473,599,862	154,138,605
	602,029,845	837,317,294

සටහන 27 විශ්‍රාමික පාරිතෝෂික බැඳියාවට එරෙහිව ආයෝජන

	2017 රු .	2016 රු .
ජනවාරි 01 දිනට ශේෂය	62,787,484	67,657,864
විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා ලද වියදම - සටහන 27 - 1	10,374,656	11,708,997
වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා ලද ආයුගණන (ලාභ/අලාභ)	12,598,135	(2,859,003)
වර්ෂය තුළ ගෙවීම්	(13,114,171)	(13,720,374)
	72,646,104	62,787,484
අඩුකිරීම්:සැලසුම් කල වත්කම්වල සාධාරණ අගය	(4,633,466)	(4,362,740)
දෙසැම්බර් 31 දිනට ශේෂය	68,012,638	58,424,744

සටහන 27.1 හඳුනා ගන්නා ලද වියදම්

	2017 රු .	2016 රු .
වර්තමාන සේවා පිරිවැය	3,869,872	3,089,385
වර්ෂය සඳහා පොළිය	6,504,784	8,619,612
	10,374,656	11,708,997

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.

සටහන 27.2 ආයු ගණන උපකල්පනය

වර්තමාන වටිනාකම ඇතුළත් විශ්‍රාම පාරිතෝශික බැඳියාව ගණනය කිරීම සඳහා යොදාගත් මූලික ආයුගණන උපකල්පන යටතට ඇතුළත් වන්නේ

	2017	2016
වට්ටම් අනුපාත	10.36%	12.74 %
වැටුප් වර්ධිත අනුපාතය	-------	------
විශ්‍රාමික වයස	60 අවුරුදු	60 අවුරුදු
සේවක පිරිවැටුම් අනුපාතය		
55 දක්වා	1.18%	1.18 %
ඊට පසු	0.00%	0.00 %

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද කළමනාකරණ චක්‍ර ලේඛ අංක 30(1) අනුව වාර්ෂික වැටුප් වැඩිවීමේ අනුපාතය සකසා ඇත.

සටහන 28 - විලම්භිත බදු වත්කම් සහ වගකීම

	2017	2016
ජනවාරි 01 වන දිනට ශේෂය	48,460,989	32,100,956
ආදායම් ප්‍රකාශනයට අය කිරීම	7,440,329	16,360,033
වර්ෂය තුළ වත්කම් හඳුනාගැනීම	--------	----------
දෙසැම්බර් 31 දිනට ශේෂය	55,901,318	48,460,989

සටහන 28.1 - විලම්භිත බදු වගකීම

	ධාරන අගය 31.12.2017	බදු පදනම 31.12.2017	ශුද්ධ 31.12.2017	ශුද්ධ 31.12.2016
දේපල පිරියත හා උපකරණ වල ප්‍රාග්ධන දීමනා මත විලම්භිත බදු වගකීම	584,987,182	46,931,144	538,056,038	465,126,992
විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව මත විලම්භිත බදු වත්කම	(72,646,104)	-------	(72,646,104)	(62,787,485)
ශුද්ධ තාවකාලික වෙනස			465,409,934	402,339,507
දේපල පිරියත හා උපකරණ වල ප්‍රාග්ධන දීමනා මත විලම්භිත බදු වගකීම	538,056,038	99.93 * 12%	64,521,528	55,658,956
		0.07 * 28%	105,459	364,660
			64,626,987	56,023,616
දේපල පිරියත හා උපකරණ වල ප්‍රාග්ධන දීමනා මත විලම්භිත බදු වත්කම	72,646,104	99.93 *12%	8,711,430	7,513,402
		0.07 * 28%	14,239	49,225
			8,725,669	7,562,627
දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පාරිතෝෂිකය මත ශුද්ධ විලම්භිත බදු වගකීම			55,901,318	48,460,989

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු.	2016 රු.

සටහන 29 ආදායම් බදු වගකීම්

ජනවාරි 01 දිනට ශේෂය	(20,918,976)	කරුණාකර සටහන් අංක 22 බලන්න
වර්ෂය සඳහා වෙන් කිරීම්	53,500,000	
වර්ෂය තුළ ගෙවීම්	(13,531,553)	
ඌණ/අධි වෙන් කිරීම් ගැලපීම්	5,308,330	
දෙසැම්බර් 31 දිනට ශේෂය	24,357,801	

සටහන 30 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ගැණුම්කරුවන්ගෙන් ලද අත්තිකාරම්	800,057	140,885,205
සුළු ණයහිමියෝ	19,745,063	10,862,244
ටෙන්ඩර් තැන්පතු	47,253,782	3,671,322
රැඳවාගත් මුදල්	14,620,416	21,051,156
සේවක වැටුප් හා ගෙවීම්	9,824,054	14,979,165
උපචිත විශ්‍රාම පාරිතෝෂික	108,728	108,728
ගෙවිය යුතු ලාභාංශ	373,448,000	212,448,000
වෙළඳ ණයහිමියෝ	931,700	931,700
	466,731,800	404,937,520

සටහන 31 වෙන්කිරීම් හා උපචිත වියදම්

වෙන් කිරීම් හා උපචිත වියදම්	64,431,082	44,211,706

සටහන 32 බැංකු අයිරා

ලංකා බැංකුව	89,515,661	
සෙලාන් බැංකුව	446,733,127	----
	536,248,788	----

සටහන 33 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම

සටහන 33.1 ප්‍රධාන කළමනාකාරණ පාර්ශවයන් සමග ඇතිවන්නාවූ ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24ට අනුව සම්බන්ධිත පාර්ශව හෙළිදරව් අනුව ප්‍රධාන කළමනාකාරීත්ව පාර්ශවයන් යන සමාගමේ, ක්‍රියාකාරකම් මෙහෙයවීම හා පාලනය කිරීම, සැලසුම්කරණය කිරීම්, මඟ පෙන්වීම සඳහා සහ පාලනය කිරීම් සඳහා වගකීමක් පවතින අයයි. ඒ අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුලත්ව) ප්‍රධාන කළමනාකාරීත්ව මණ්ඩලය ලෙස වර්ගීකරණය කර ඇත.

ප්‍රධාන කළමණාකරන පාර්ශවයන් සමඟ ඇති වන්නාවූ ගනුදෙනු පහත දැක්වේ.

	2017 දෙසැම්බර් 31 රු.	2016 දෙසැම්බර් 31 රු.
ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන් සඳහා දරණ ලද වියදම්	1,348,823	658,000
ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන්සඳහා දෙන ලද ණය සහ අත්තිකාරම්	නැත	නැත

සටහන 33.2 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

සැලකිය යුතු සම්බන්ධිත පාර්ශව ගනුදෙනු වල තොරතුරු පහත පරිදි වේ:-

ආයතනයේ නම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	වටිනාකම 2017 රු.	වටිනාකම 2016 රු.
භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් සමාලෝචනය	සම්බන්ධිත ව්‍යාපාර	ගෙවන ලද පුරස්කාර	101,651,381	82,806,351
ජනතා වතු සංවර්ධන අධිකාරිය		ණය ලැබීම්	15,000,000	15,000,000
ජාතික කඩදාසි සමාගම		ණය ලැබීම්	5,000,000	5,000,000
රාජ්‍ය සම්පත් කළමණාකරන සංස්ථාව	සම්බන්ධිත ව්‍යාපාර	ණය ලැබීම්	----	500,000,000
රාජ්‍ය වැවිලි සංස්ථාව		ණය ලැබීම්	25,000,000	25,000,000
ශ්‍රී ලංකා මහ බැංකුව		තැන්පතුවලින් උපයන ලද පොළී	85,000,000	33,136,012
ශ්‍රී ලංකා මහ බැංකුව		තැන්පතු වලින් ආපසු ගැනීම්	1,860,000,000	1,801,370,609

සටහන 34 වාර්තා කරන කාලච්ඡේදය අවසානයට පසුව පැන නැගෙන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍යවන සිදුවීමක් වාර්තාකරන කාලච්ඡේදය අවසානයට පසුව පැන නැගී නොමැත.

සටහන 35 බැඳීම්

බණිජ වැලි තොග ඇපයට තබා රු.මිලියන 100 ක් වටිනා අයිරා පහසුකමක් ලංකා බැංකුවෙන් ලබාගෙන ඇත. තවද රු.මිලියන 440 ක අයිරා පහසුකමක් සෙලාන් බැංකුවෙන් ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබා ගෙන ඇත. මෙම පහසුකම් දෙකම වර්ෂය තුළ පාවිච්චිකර ඇත.

සටහන 36 අසම්භාවයන්

මූල්‍ය වාර්තාවල ගැලපීමකට හෝ හෙළිදරව් කිරීමකට අවශ්‍යවන අසම්භාව්‍ය වගකීමක් වාර්තාකරන කාලච්ඡේදය අවසානයට පසුව පැන නැගී නොමැත.